# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1786/3 - 2012 නොවැම්බර් මස 26 වැනි සඳුදා - 2012.11.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2012 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,  
සභාපති,  
අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා  
ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 22 වැනි දින,  
කොළඹ 05,  
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1963 පෙබරවාරි මස 27 වැනි දින අංක 13535 දරන ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජූලි මස 30 වැනි දින අංක 1664/24 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*උපලේඛනය (සම්බන්ධිතයි)*

*II වැනි කොටස*

*I වැනි තීරය*

***කම්කරුවන්ගේ පන්තිය***

*I වැනි ශ්‍රේණිය :*

ප්‍රධාන අයිස් ක්‍රීම්/ පළතුරු යුෂ/ජෑම් සාදන්නෝ, (ස්වභාවික හා කෘත්‍රිම රසකාරක යොදා) කංකානම්වරු, ප්‍රධාන සිරප් සාදන්නෝ, ජල පවිත්‍ර යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කෑන් සාදන්නෝ, වඩුවෝ (ස්වයංකාරී) පුරවන්නෝ, හරිවැරදි බලන්නෝ.

*II වැනි ශ්‍රේණිය :*

සහකාර අයිස්ක්‍රීම්/ පළතුරු යුෂ/ ජෑම් සාදන්නෝ, (ස්වභාවික හා කෘත්‍රිම රසකාරක යොදා ) මෙම කර්මාන්තයට අදාළ ද්‍රව්‍ය නිපදවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ, කෑන් අලුත්වැඩියා කරන්නෝ, කාබන්ඩයොක්සයිඩ් වායු පාලනය කරන්නෝ, සහකාර සිරප් සාදන්නෝ, සිරප්වරු, ක්‍රවුනර්වරු, ශුද්ධ බෝතල පිරික්සන්නෝ, කාබනේටර් ඔපරේටර්වරු, නිෂ්පාදිතයන් ගණන් කරන්නෝ, (අතින්) පුරවන්නෝ, ( ස්වයංකාරී) ලේබල් කරන්නෝ, සෝදනයන්ගෙන් බෝතල් ඉවත් කරන්නෝ, ස්වයංකාරී යන්ත්‍රවලින් සිසිල් බීම නිපදවීමේ නියුක්ත වෙනත් කම්කරුවෝ, අයිස් නෙලන්නෝ.

*III වැනි ශ්‍රේණිය :*

අයිස්ක්‍රීම්/ පළතුරු යුෂ/ ජෑම් බඳුන් පුරවන්නෝ, අයිස්ක්‍රීම්/ පළතුරු යුෂ/ ජෑම් අසුරන්නෝ, අයිස් අසුරන්නෝ, අයිස් පැක්කරන්නෝ, අයිස් පටවන්නෝ, සිරප් කාමර කම්කරුවෝ, බෝතල් මිටි කඩන්නෝ, බෝතල් තෝරන්නෝ නොහොත් ශුද්ධ කරන්නෝ, සෝදනයට බෝතල් දමන්නෝ, පෙට්ටි පුරවන්නෝ, බෝතල් පැක් කරවන්නෝ, ශුද්ධ කරන්නෝ නොහොත් අතුගාන්නෝ, බෝතල් අතින් ශුද්ධ කරන්නෝ, පෙට්ටි ගෙනයන්නෝ නොහොත් අට්ටි ගසන්නෝ, ගබඩා කම්කරුවෝ, (අතින්) ලේබල් කරන්නෝ, රථවලට බඩු පටවන්නෝ.

***මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය***

| සේවා වර්ෂය | I වැනි ශ්‍රේණිය<br>රු. ශ. | II වැනි ශ්‍රේණිය<br>රු. ශ. | III වැනි ශ්‍රේණිය<br>රු. ශ. |
|---|---|---|---|
| 1 වර්ෂය | 10,125 00 | 9,720 00 | 9,315 00 |
| 2 වර්ෂය | 10,275 00 | 9,845 00 | 9,415 00 |
| 3 වර්ෂය | 10,425 00 | 9,970 00 | 9,515 00 |
| 4 වර්ෂය | 10,575 00 | 10,095 00 | 9,615 00 |
| 5 වර්ෂය | 10,725 00 | 10,220 00 | 9,715 00 |
| 6 වර්ෂය | 10,875 00 | 10,345 00 | 9,815 00 |
| 7 වර්ෂය | 11,025 00 | 10,470 00 | 9,915 00 |
| 8 වර්ෂය | 11,175 00 | 10,595 00 | 10,015 00 |
| 9 වර්ෂය | 11,325 00 | 10,720 00 | 10,115 00 |
| 10 වර්ෂය | 11,475 00 | 10,845 00 | 10,215 00 |
| 11 වර්ෂය | 11,625 00 | 10,970 00 | 10,315 00 |
| 12 වර්ෂය | 11,775 00 | 11,095 00 | 10,415 00 |
| 13 වර්ෂය | 11,925 00 | 11,220 00 | 10,515 00 |
| 14 වර්ෂය | 12,075 00 | 11,345 00 | 10,615 00 |
| 15 වර්ෂය | 12,225 00 | 11,470 00 | 10,715 00 |
| 16 වර්ෂය | 12,375 00 | 11,595 00 | 10,815 00 |
| 17 වර්ෂය | 12,525 00 | 11,720 00 | 10,915 00 |
| 18 වර්ෂය | 12,675 00 | 11,845 00 | 11,015 00 |

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය (සම්බන්ධිතයි)*

| *සේවා වර්ෂය* | *I වැනි ශ්‍රේණිය රු. ශ.* | *II වැනි ශ්‍රේණිය රු. ශ.* | *III වැනි ශ්‍රේණිය රු. ශ.* |
|---|---|---|---|
| 19 වර්ෂය | 12,825 00 | 11,970 00 | 11,115 00 |
| 20 වර්ෂය | 12,975 00 | 12,095 00 | 11,215 00 |
| 21 වර්ෂය | 13,125 00 | 12,220 00 | 11,315 00 |
| 22 වර්ෂය | 13,275 00 | 12,345 00 | 11,415 00 |
| 23 වර්ෂය | 13,425 00 | 12,470 00 | 11,515 00 |
| 24 වර්ෂය | 13,575 00 | 12,595 00 | 11,615 00 |
| 25 වර්ෂය | 13,725 00 | 12,720 00 | 11,715 00 |

121-249/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගුදිරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උප උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිදි වෙනස් කිරීමට ගුදිරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
ගුදිරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ
කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ගුදිරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1962 ජුනි මස 29 වැනි දින අංක 13187 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, වරින්වර වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ තීරණයෙහි II වැනි හා III වැනි කොටස් පහත සඳහන් අලුත් කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*උපලේඛනය (සම්බන්ධිතයි)*

*II වැනි කොටස*

***කැලි මිම්මේ වැඩ සඳහා වැටුප්***

1. ඇට කෙඳි කොහු අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් පිරවීම සහ සම්මත අත් මිටිවලට බැඳීම. (එනම් පිටරට යැවීම සඳහා සකස් කිරීම)
2. ඇට කෙඳි කොහු අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් සම්මත අත් මිටිවලට නොබැඳ පාට කිරීම පිණිස අතින් සකස් කිරීම. (එනම් පිටරට යැවීම සඳහා)
3. අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් අතින් පිරවීම හා අත් මිටිවලට බැඳීම. ( එනම් පිටරට යැවීම සඳහා)

| *සේවා වර්ෂය* | *බැමි 3 (කි.ග්‍රෑම් 100) රු. ශ.* | *බැමි 2 (කි.ග්‍රෑම් 100) රු. ශ.* | *පාට කිරීම සඳහා අතින් පිරවීම (කි.ග්‍රෑම් 100) රු. ශ.* | *පාට කිරීම බැමි 3 (කි.ග්‍රෑම් 100) රු. ශ.* | *පාට කිරීම බැමි 2 (කි.ග්‍රෑම් 100) රු. ශ.* |
|---|---|---|---|---|---|
| 1 වැනි සේවා වර්ෂය | 1,360 75 | 1,350 00 | 907 20 | 1,521 25 | 1,501 75 |
| 2 වැනි සේවා වර්ෂය | 1,367 25 | 1,355 80 | 957 20 | 1,527 05 | 1,507 55 |
| 3 වැනි සේවා වර්ෂය | 1,373 75 | 1,361 60 | 1,007 20 | 1,532 85 | 1,513 35 |
| 4 වැනි සේවා වර්ෂය | 1,380 25 | 1,367 40 | 1,057 20 | 1,538 65 | 1,519 15 |
| 5 වැනි සේවා වර්ෂය | 1,386 75 | 1,373 20 | 1,107 20 | 1,544 45 | 1,524 95 |
| 6 වැනි සේවා වර්ෂය | 1,393 25 | 1,379 00 | 1,157 20 | 1,550 25 | 1,530 75 |
| 7 වැනි සේවා වර්ෂය | 1,399 75 | 1,384 80 | 1,207 20 | 1,556 05 | 1,536 55 |
| 8 වැනි සේවා වර්ෂය | 1,406 25 | 1,390 60 | 1,257 20 | 1,561 85 | 1,542 35 |
| 9 වැනි සේවා වර්ෂය | 1,412 75 | 1,396 40 | 1,307 20 | 1,567 65 | 1,548 15 |
| 10 වැනි සේවා වර්ෂය | 1,419 25 | 1,402 20 | 1,357 20 | 1,573 45 | 1,553 95 |
| 11 වැනි සේවා වර්ෂය | 1,425 75 | 1,408 00 | 1,407 20 | 1,579 25 | 1,559 75 |
| 12 වැනි සේවා වර්ෂය | 1,432 25 | 1,413 80 | 1,457 20 | 1,585 05 | 1,565 55 |
| 13 වැනි සේවා වර්ෂය | 1,438 75 | 1,419 60 | 1,507 20 | 1,590 85 | 1,571 35 |
| 14 වැනි සේවා වර්ෂය | 1,445 25 | 1,425 40 | 1,557 20 | 1,596 65 | 1,577 15 |
| 15 වැනි සේවා වර්ෂය | 1,451 75 | 1,431 20 | 1,607 20 | 1,602 45 | 1,582 95 |
| 16 වැනි සේවා වර්ෂය | 1,458 25 | 1,437 00 | 1,657 20 | 1,608 25 | 1,588 75 |
| 17 වැනි සේවා වර්ෂය | 1,464 75 | 1,442 80 | 1,707 20 | 1,614 05 | 1,594 55 |
| 18 වැනි සේවා වර්ෂය | 1,471 25 | 1,448 60 | 1,757 20 | 1,619 85 | 1,600 35 |
| 19 වැනි සේවා වර්ෂය | 1,477 75 | 1,454 40 | 1,807 20 | 1,625 65 | 1,606 15 |
| 20 වැනි සේවා වර්ෂය | 1,484 25 | 1,460 20 | 1,857 20 | 1,631 45 | 1,611 95 |
| 21 වැනි සේවා වර්ෂය | 1,490 75 | 1,466 00 | 1,907 20 | 1,637 25 | 1,617 75 |
| 22 වැනි සේවා වර්ෂය | 1,497 25 | 1,471 80 | 1,957 20 | 1,643 05 | 1,623 55 |
| 23 වැනි සේවා වර්ෂය | 1,503 75 | 1,477 60 | 2,007 20 | 1,648 85 | 1,629 35 |
| 24 වැනි සේවා වර්ෂය | 1,510 25 | 1,483 40 | 2,057 20 | 1,654 65 | 1,635 15 |
| 25 වැනි සේවා වර්ෂය | 1,516 75 | 1,489 20 | 2,107 20 | 1,660 45 | 1,640 95 |
| 26 වැනි සේවා වර්ෂය | 1,523 25 | 1,495 00 | 2,157 20 | 1,666 25 | 1,646 75 |

*III වැනි කොටස*

***කාල මිම්මේ වැඩ සඳහා අවම වැටුප***

***සේවක පන්තිය***

*II වැනි ශ්‍රේණිය :*

ලොරිවලින් හෝ කරත්තවලින් ගබඩාවලට ඇට කෙඳි කොහු භාරගැනීම, බැලස් සහ මිටි ගණන් කිරීම බැලස් සහ මිටිවල බර කිරීම, කොහු තේරීම, බැලස් සහ මිටි අට්ටි ගැසීම, බැලස් සහ මිටි අට්ටි කැඩීම, බැලස් සහ මිටි ලිහීම, අනවශ්‍ය දේ අස්කිරීම සහ ශුද්ධ කිරීම, අවුල් කොහු මිටිකර බැඳීම, අවුල් කොහු වේලීම, බැලස් සහ මිටි ගබඩාවේ එක් අංශයක සිට තවත් අංශයකට ගෙන යාම, කැපූ ඇට කෙඳි අත් මිටිවල අත් කොන් කැපීම, ඇඹරූ කොහු සුළි දැමීම, බැලස් කිරීම හෝ දරණු ගැසීම, පාට පෙවීම සඳහා දර කැපීම, පීරීම සඳහා තෙල් දීම, ඇට කෙඳි බැමි කැපීම, ගබඩා සහ කාණු පිස දැමීම, කොහු බත් සහ කුණු රොඩු කරත්තවල පටවා ඉවතට ගෙන යාම, ඉවතට ගෙන යාම සඳහා කොහුබත් සහ කුණු රොඩු වාහනවල පැටවීම, කොහු බත් හැලීම, කොහුබත් සහ කුණු රොඩු ගෝනි කිරීම, තේ පිළියෙල කිරීම, තේ සහ කෑම බෙදීම, කොහු පැක් කිරීමේ දී සහ සකස් කිරීමේ දී පාවිච්චි වන විවිධ ද්‍රව්‍යයන් භාර ගැනීම, ගණන් කිරීම, බර කිරීම, අඩුක් කිරීම, ඉවතට ගෙන යාම, කැපීම සහ පිළියෙල කිරීම, බැලස් සහ මිටි ගබඩාවෙන්, දුම්දෙන කුටියෙන් හෝ සායම් පොවන තැනින් බේල් ප්‍රෙස් යන්ත්‍රය කරා ගෙනයාම, පෙට්ටි කරන්නන් අතට කොහු යැවීම, ප්‍රෙස් පෙට්ටි වැඩ කිරීම පිණිස වින්ච් ක්‍රියා කරවීම, උණබම්බු ඉරීම සහ පැලීම, වළයම් පටි කැපීම, කොහු කඹ දිග හැරීම, ප්‍රෙස් යන්ත්‍රය, තට්ටුව, වළ සහ වටා පිටාව පිස දැමීම සහ ශුද්ධ කිරීම, බේල් මිටි හන රෙදි වලින් වසා මැසීම, කඩදාසිවලින් හෝ හණ රෙදිවලින් බැලස් එතීම සහ නැවට යැවීම සඳහා බඩු මිටි සියල්ල ලකුණු කිරීම යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ.

*මධ්‍යම ශ්‍රේණිය :*

බිම් මට්ටමේ තිබෙන කොහු ප්‍රෙස් තට්ටුවට (උසක පිහිටා තිබේනම් ) විසි කිරීම, ශුද්ධ කිරීමේ යන්ත්‍රවලට කොහු ඇල්ලීම,බැලස් පෙට්ටිවල කොහු බැලස් කිරීම, කොහු ලණුවලින් කොහු කඹ ඇඹරීම, කොහුවලට ගෙන්දගම් දුම් දැමීමේ වැඩ කටයුතු , ඇට කෙඳි අත්මිටි නියමිත ප්‍රමාණවලට කැපීම සහ කොහු පාට කිරීමේ වැඩ යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ.

*I වැනි ශ්‍රේණිය :*

යාන්ත්‍රික ජම්බාර වලින් හෝ වෙනත් ක්‍රම වලින් බේල් පෙට්ටිවලට කොහු ඇහිරීම, බේල් ප්‍රෙස් යන්ත්‍රය පාලනය කිරීම සහ ක්‍රියාකරවීම , බේල් පටි වලයම් පටිවලින් හෝ කඹ වලින් වෙලීම, බේල් අට්ටි ගැසීම, අට්ටි කැඩීම, උසුලාගෙන යාම, ඉවත් කිරීම, පැටවීම සහ බෑම, ඇට කෙඳි ඇඹරීම සහ සුළි දැමීම යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ.

| *සේවා වර්ෂය* | වැඩකරුවෝ<br>*II වැනි ශ්‍රේණිය*<br>*රු. ශ.* | *මධ්‍යම ශ්‍රේණිය*<br>*රු. ශ.* | *I වැනි ශ්‍රේණිය*<br>*රු. ශ.* | *බේල්කරන යන්ත්‍රයේ ප්‍රධාන ක්‍රියාකරුවන්*<br>*රු. ශ.* |
|---|---|---|---|---|
| 1 වැනි සේවා වර්ෂය | 9,315 00 | 9,720 00 | 10,530 00 | 10,125 00 |
| 2 වැනි සේවා වර්ෂය | 9,415 00 | 9,845 00 | 10,680 00 | 10,300 00 |
| 3 වැනි සේවා වර්ෂය | 9,515 00 | 9,970 00 | 10,830 00 | 10,475 00 |
| 4 වැනි සේවා වර්ෂය | 9,615 00 | 10,095 00 | 10,980 00 | 10,650 00 |
| 5 වැනි සේවා වර්ෂය | 9,715 00 | 10,220 00 | 11,130 00 | 10,825 00 |
| 6 වැනි සේවා වර්ෂය | 9,815 00 | 10,345 00 | 11,280 00 | 11,000 00 |
| 7 වැනි සේවා වර්ෂය | 9,915 00 | 10,470 00 | 11,430 00 | 11,175 00 |
| 8 වැනි සේවා වර්ෂය | 10,015 00 | 10,595 00 | 11,580 00 | 11,350 00 |
| 9 වැනි සේවා වර්ෂය | 10,115 00 | 10,720 00 | 11,730 00 | 11,525 00 |
| 10 වැනි සේවා වර්ෂය | 10,215 00 | 10,845 00 | 11,880 00 | 11,700 00 |
| 11 වැනි සේවා වර්ෂය | 10,315 00 | 10,970 00 | 12,030 00 | 11,875 00 |

වැඩකරුවෝ (සම්බන්ධිතයි)

| සේවා වර්ෂය | II වැනි ශ්‍රේණිය රු. ශ. | මධ්‍යම ශ්‍රේණිය රු. ශ. | I වැනි ශ්‍රේණිය රු. ශ. | බේල්කරන යන්ත්‍රයේ ප්‍රධාන ක්‍රියාකරුවන් රු. ශ. |
|---|---|---|---|---|
| 12 වැනි සේවා වර්ෂය | 10,415 00 | 11,095 00 | 12,180 00 | 12,050 00 |
| 13 වැනි සේවා වර්ෂය | 10,515 00 | 11,220 00 | 12,330 00 | 12,225 00 |
| 14 වැනි සේවා වර්ෂය | 10,615 00 | 11,345 00 | 12,480 00 | 12,400 00 |
| 15 වැනි සේවා වර්ෂය | 10,715 00 | 11,470 00 | 12,630 00 | 12,575 00 |
| 16 වැනි සේවා වර්ෂය | 10,815 00 | 11,595 00 | 12,780 00 | 12,750 00 |
| 17 වැනි සේවා වර්ෂය | 10,915 00 | 11,720 00 | 12,930 00 | 12,925 00 |
| 18 වැනි සේවා වර්ෂය | 11,015 00 | 11,845 00 | 13,080 00 | 13,100 00 |
| 19 වැනි සේවා වර්ෂය | 11,115 00 | 11,970 00 | 13,230 00 | 13,275 00 |
| 20 වැනි සේවා වර්ෂය | 11,215 00 | 12,095 00 | 13,380 00 | 13,450 00 |
| 21 වැනි සේවා වර්ෂය | 11,315 00 | 12,220 00 | 13,530 00 | 13,625 00 |
| 22 වැනි සේවා වර්ෂය | 11,415 00 | 12,345 00 | 13,680 00 | 13,800 00 |
| 23 වැනි සේවා වර්ෂය | 11,515 00 | 12,470 00 | 13,830 00 | 13,975 00 |
| 24 වැනි සේවා වර්ෂය | 11,615 00 | 12,595 00 | 13,980 00 | 14,150 00 |
| 25 වැනි සේවා වර්ෂය | 11,715 00 | 12,720 00 | 14,130 00 | 14,325 00 |
| 26 වැනි සේවා වර්ෂය | 11,815 00 | 12,845 00 | 14,280 00 | 14,500 00 |

12 - 249/2

---

**පඩිපාලක සභා ආඥා පනත**

නිවේදනයයි

**සම් පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වන විරෝධතාවයන්, 2012 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක් ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
සම් පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ
සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තය පිළිබඳ වූ පඩි පාලක සභාව විසින් ඇති කරනු ලදුව 1970 අගෝස්තු මස 28 වැනි දින අංක 14921 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබුවා වූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2010 ජුනි මස, 30 දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද එම උපලේඛනයට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

සම්පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තයේ නියුක්ත පහතින් දක්වා ඇති සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පහත වගුවෙන් දැක්වෙන පරිදි විය යුතු ය.

**සේවක පන්ති**

*සම්පදම් කිරීම*

***I වැනි ශ්‍රේණිය :***

අමු සම් ශුද්ධ කිරීම, හුණු වලෙහි දමා සම් තැම්බීම, සම්වලින් ලොම් ඉවත් කිරීම, සමෙහි ජර් කැපීම, රසායනික ද්‍රව්‍ය ආලේප කිරීම, පදම් කිරීමෙන් පසු සම් ශුද්ධ කිරීම, තෙල් ගෑම, සම් තුනී කිරීම, සම් මොලොක් කිරීම, දියෙහි දැමීම, ලුණු අතගෑම, සම් මැදීමෙන් තෙල් ඉවත් කිරීම.

***II වැනි ශ්‍රේණිය :***

සම් තැලීම, සම්පාට කිරීම, පෙරලා අට්ටි ගැසීම, යුත්තු කැපීම, සම් තේරීම හා වර්ග කිරීම, වැලි කඩදාසි අල්ලා ශුද්ධ කිරීම, යන්ත්‍ර ක්‍රියා කරවීම, සමෙහි රැලි ඉවත් කිරීම.

***III වැනි ශ්‍රේණිය :***

පිටි අතගා වේලීම, සම් වේලීම, ශුද්ධ කරන්නන් හා අතු ගාන්නන්ගේ වැඩ, ඉහත සඳහන් වැඩවලට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වූ වෙනත් කාර්යයන්.

***පාවහන් නිපදවීම හා අළුත්වැඩියා කිරීම***

***I වැනි ශ්‍රේණිය :***

සංයෝග කිරීම, උඩුකර සෑදීම, ආස්කර ඇලවීම (යාන්ත්‍රික), පතුල් කැපීම, උඩුකර කැපීම, වටේ කැපීම, ඇණ තැබීම, පතුල් තද කිරීම, විලුම් තද කිරීම, විලුම් සෑදීම, උඩුකර යන්ත්‍රානුසාරයෙන් කැපීම, ඒජ් සෙට් කිරීම.

***II වැනි ශ්‍රේණිය :***

උඩුකර බයිංඩිං මැසීම, සිදුරු කිරීම, හැරීම, බකල් සවි කිරීම, පතුල් මැසීම, පතුල් මැදීම, රැහීම, සොලියුෂන් සෑදීම, චැම්ප් ඇලවීම, අයිලට් සවි කිරීම.

***III වැනි ශ්‍රේණිය :***

රබර් බදාම මිශ්‍ර කිරීම, පටි කැපීම, උඩුකර රිවට් කිරීම, බදාමයෙහි ගිල්වීම, උඩුකර ඇතුල් කිරීම, උඩුකර සකස් කිරීම, පිටුපස බැස්ම ඇලවීම , පතුල් ඇලවීම, ඔප දැමීම, නිම කිරීම, පෙට්ටි නිකුත් කිරීම, පෙට්ටිවල ලේබල් ඇලවීම, පෙට්ටි මුද්‍රා කිරීම, ශුද්ධ කරන්නන්ගේ සහ අතුගාන්නන්ගේ වැඩ, ඉහත සඳහන් වැඩ වලට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වූ වෙනත් කාර්යයන්.

***සම් භාණ්ඩ සෑදීම***

*I වැනි ශ්‍රේණිය* :

යන්ත්‍රයෙන් හා අතින් කැපීම, සම් විදීම හා සිදුරු කිරීම, රිවට් සවි කිරීම, තද කිරීම, ගමන් මළු ඩොකියුමන්ට් කේස් හා පසුම්බි සෑදීම, (අතින්), ෆුට් බෝල්, වොලිබෝල් සහ නෙට්බෝල් සෑදීම.

*II වැනි ශ්‍රේණිය* :

ස්ටඩ් බකල් සහ බොත්තම් සවි කිරීම, මුද්‍රා කිරීම, යතුරු තහඩු උපකරණ හා හැන්ඩ්ල් සවි කිරීම, මැහීම, ගමන් මළු ඩොකියුමන්ට් කේස් හා පසුම්බි සෑදීම (යාන්ත්‍රානුසාරයෙන්),

*III වැනි ශ්‍රේණිය* :

සලකුණු කිරීම, බදාම සහ පාප්ප ගෑම, නිම කිරීම, පිම්බීම, හා මුද්‍රා තැබීම

*වෘත්තිය හදාරන්නෝ සහ ආධුනිකයෝ :*

ඉහත වෘත්තීය හදාරන්නෙකු හෝ ආධුනිකයෙකු සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුතු වූ කාලසීමාවක් ලෙස සැලකිය යුතු ය.

ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණය

*සම් පදම් කිරීම, පාවහන් හා සම්භාණ්ඩ සෑදීම*

| *සේවා වසර* | *I ශ්‍රේණිය රු. ශත* | *II ශ්‍රේණිය රු. ශත* | *III ශ්‍රේණිය රු. ශත* | *වෘත්තීය හදාරන්නන් හා ආධුනිකයෝ රු. ශත* |
|---|---|---|---|---|
| 1 වැනි වසර | 10,500 00 | 10,080 00 | 9,660 00 | 5,820 00 |
| 2 වැනි වසර | 10,650 00 | 10,205 00 | 9,760 00 | |
| 3 වැනි වසර | 10,800 00 | 10,330 00 | 9,860 00 | |
| 4 වැනි වසර | 10,950 00 | 10,455 00 | 9,960 00 | |
| 5 වැනි වසර | 11,100 00 | 10,580 00 | 10,060 00 | |

12 - 249/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.